# පො / දිවුලන්කඩවල මධ්‍ය මහා විද්‍යාලය

**12 ශ්‍රේණිය (අ.පො.ස. උ.පෙළ. 2020)**

**පළමු වාර පරීක්ෂණය ( 2018 ජුලි )**

| ගිණුම්කරණය | 33 | S | I / II | ලකුණු | |
|---|---|---|---|---|---|

**උපදෙස් :**

කාලය පැය 2 විනාඩි 30 යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි. මුළු ලකුණු 100

නම / විභාග අංකය:------------------------------------------------------------------------------------------------------------

**1 - කොටස**

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න අංක 1 සිට 11 දක්වා වඩාත් සුදුසු පිළිතුර තෝරා වරහන් තුල දක්වන්න.**

1. ආයතනයක මූල්‍ය ගිණුම්කරණයෙහි මූලික අරමුණ කුමක්ද?

( 1 ) තීරණ ගැනීමට කළමනාකරුවන්ට තොරතුරු සැපයීම.
( 2 ) ආදායම් මත බදු අය කිරීම සඳහා රජයට තොරතුරු සැපයීම.
( 3 ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් පළ කිරීම සඳහා විගණකවරුන්ට තොරතුරු සැපයීම.
( 4 ) මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල වීම අධීක්ෂණය කිරීමට තොරතුරු සැපයීම.
( 5 ) ආයතනයක පිළිබඳව ඇල්මක් දක්වන බාහිර පාර්ශවවලට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීම.

(............)

2. පහත දැක්වෙන්නේ ගිණුම්කරණය මගින් සපයන තොරතුරු ඇසුරෙන් ඇල්මැති පාර්ශවයන් ගනු ලබන තීරණ කිහිපයකි. එම තීරණ ගනු ලබන වඩාත් සුදුසු ඇල්මැති පාර්ශව පිළිවෙලින්,

| | | |
|---|---|---|
| I. | සපයා ඇති ණය ආපසු ලබාගත හැකිද? | A - සේවකයන් |
| II. | රැකියාවේ සුරක්ෂිත භාවයක් තිබේද? | B - රාජ්‍ය ආයතන |
| III. | නියමිත පරිදි බදු ගෙවන්නේද? | C - අයිතිකරුවන් |
| IV. | තවදුරටත් ආයෝජනය කල යුතුද? | D - ණයහිමියන් |

1. DBCA 2. CDAB 3. DABC 4. DACB 5. ABDC (..........)

3. ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණය ගොඩනැගීමට මූලික පදනම වන සංකල්පය වන්නේ,

1. මූල්‍ය මිනුම් සංකල්පය 2. ගැලපුම් සංකල්පය 3. උපචිත සංකල්පය
4. ගනුදෙනු සංකල්පය 5. ඒකක සංකල්පය (...........)

4. පහත ගිණුම්කරණයට අදාළ ප්‍රකාශ වලින් වැරදි ප්‍රකාශය වන්නේ,

1. මුල්‍ය ගිණුම්කරණයේදී, ගිණුම්කරණ සංකල්ප, නීති රීති, සම්ප්‍රදායයන් හා ගිණුම්කරණ ප්‍රමිත යොදාගනියි.
2. මුල්‍ය ගිණුම්කරණයේ දී, අවශ්‍ය ඕනෑම අවස්ථාවන්හි තොරතුරු ඉදිරිපත් කිරීම කරයි.
3. කළමනාකරණ ගිණුම්කරණයේ දී, ඓතිහාසික හා පුරෝකථන තොරතුරු යොදා ගනියි.
4. ගිණුම්කරණ ඒකකය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍යවන්නා වූ ආර්ථික තොරතුරු, සන්නිවේදනය කිරීම'' ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වේ.
5. ගිණුම්කරණය මුල්‍ය හා කළමනාකරණය ලෙස ප්‍රධාන වශයෙන් වර්ගකරයි. (..........)

5. වැරදි ගිණුම්කරණ සමීකරණයක් වන්නේ,

1. වත්කම් = හිමිකම + ජංගම නොවන වගකීම් + ජංගම වගකීම්
2. ජංගම නොවන වත්කම් = හිමිකම + වගකීම් - ජංගම වත්කම්
3. (ජංගම නොවන වත්කම් + ජංගම වත්කම් ) - හිමිකම - ජංගම වගකීම් = ජංගම නොවන වගකීම්
4. හිමිකම් + (අදායම් - වියදම්) + ජංගම නොවන වගකීම් + ජංගම වගකීම් = වත්කම්
5. වගකීම් - අදායම් + වියදම් = හිමිකම - ජංගම නොවන වත්කම් - ජංගම වත්කම් (..........)

6. පහත සඳහන් ගනුදෙනු අතරින් ව්‍යාපාරයේ හිමිකමට බලපාන ගනුදෙනුව ඇතුලත් පිළිතුර වන්නේ,

1. ව්‍යාපාරයට රු 50 000ක ලී බඩු උපකරණ මිලට ගැනීම.
2. රු 100 000 ක බැංකු ණයක් ගත්තා.
3. දිනපාලගෙන් රු 30 000ක භාණ්ඩ තොගයක් ණයට ගත්තා.
4. ලද කුලී අදායම රු 50 000කි.
5. සේවකයෙක්ට රු 10 000ක ණයක් දුන්නා. (...........)

7. වත්කම් = A , වගකීම් = L , ශුද්ධ වත්කම් = NA , නම් වැරදි ගිණුම්කරණ සමීකරණයක් විය හැක්කේ,

1. NA = A - L
2. A = NA + L
3. A = NA
4. L = A - NA
5. NA = A + L

(.........)

**ප්‍රශ්න අංක 08 සිට 11 දක්වා පහත තොරතුරු ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.**

පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක 2016.03.01 දිනට පැවති වත්කම් හා වගකීම් පිළිබඳ තොරතුරු වේ.
තොගය රු 30 000, මුදල් රු 10 000, ණය හිමියෝ රු 12 000,
ණය ගැතියෝ රු 32 000, උපචිත වියදම් රු 3 000, ගොඩනැගිලි රු 100 000,
බැංකු ණය රු 20 000,

මාසය තුල අයිතිකරුගේ පෞද්ගලික ගැනිලි රු 7 000ක් වූ අතර , අයිතිකරු විසින් 2016.03.20 දින රු 15 000ක් වටිනා පරිඝනකයක් ව්‍යාපාරයට යොදවයි. මාර්තු මාසය තුල රු 20 000ක ලාභයක් ඉපැයුවේ නම්,

8. 2016.03.01 දිනට ජංගම වත්කම් වන්නේ,

1. රු 120 000 2. රු 172 000 3. 135 000 4. 220 000 5. 72 000 (..........)

9. 2016.03.01 දිනට ජංගම නොවන වගකීම් වන්නේ,

1. රු 120 000 2. රු 160 000 3. 135 000 4. 20 000 5. 100 000 (...........)

10. 2016.03.01 දිනට ශුද්ධ වත්කම් වන්නේ,

1. රු 105 000 2. රු 137 000 3. 185 000 4. 140 000 5. 85 000 (...........)

11. 2016.03.31 දිනට ශුද්ධ වත්කම් වන්නේ,

1. රු 100 000 2. රු 165 000 3. රු 97 000 4. රු 53 000 5.රු 20 000 (...........)

**ප්‍රශ්න අංක 12 සිට 25 දක්වා හිස්තැන් පුරවන්න.**

12. ගිණුම්කරණ පරිසරයේදී , ආර්ථික හා දේශපාලන පරිසරයට අයත් විචල්‍ය මොනවාද?

I. ------------------------------------------------------------
II. ------------------------------------------------------------
III. ------------------------------------------------------------
IV. ------------------------------------------------------------

13. පහත දක්වා ඇත්තේ ගිණුම්කරණ විෂය හදාරණ ශිෂ්‍යයෙකු විසින් විෂය කරුණක් සම්බන්දව ලියන ලද නිර්වචනයකි,

“ ගිණුම්කරණ ඒකකයක අතීත ගනුදෙනු හා සිද්ධීන්වලට අදාළ තොරතුරු ආර්ථිකමය තීරණ ගැනීමට සුදුසු වන ආකාරයට සකස් කර, බාහිර පාර්ශ්වයන් වෙත ඉදිරිපත් කිරීම.”

ඉහත නිර්වචනයට කියවෙන්නේ, -------------------------------------------- ගැනය.

14. පහත සඳහන් අංගයන්ට අදාලව මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණයට අදාලව වෙනස දක්වන්න,

| අංගය | මූල්‍ය ගිණුම්කරණය | කළමනාකරණ ගිණුම්කරණය |
|---|---|---|
| ( අ) තොරතුරු භාවිතා කරන්නන් | | |
| ( ආ ) තොරතුරු භාවිතා කිරීමේ වාර ගණන | | |

15. ජංගම වත්කමක් වීමට පහත සඳහන් එක් ලක්ෂණයක් වත් තිබිය යුතුය.

-----------------------------------------------------------------------------
-----------------------------------------------------------------------------
-----------------------------------------------------------------------------

**ප්‍රශ්න අංක 16 සිට 19 දක්වා දැක්වෙන ප්‍රකාශ සත්‍ය නම් ( ✓ ) ලකුණද අසත්‍ය නම් ( ✗ ) ලකුණද යොදන්න.**

16. අදායම් වැඩිවීම්, වත්කම් වැඩිවීමෙන් පමණක් සිදුවේ. (      )

17. වියදම් වැඩිවීමෙන් සැමවිටම වත්කම් අඩුවේ. (      )

18. හිමිකම ප්‍රාග්ධනයෙහි කොටසක් වේ. (      )

19. වත්කම් වෙනස් වීම හිමිකම වෙනස් වීමෙන් පමණක් සිදුවේ. (      )

**20 සිට 21 දක්වා ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයේ වාර්තා කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිඵලය පෙන්වන්න.**

20. රු 50 000ක ණය වාරිකයක් රු 5 000 ක ණය පොලියක් සහිතව අයිතිකරු තම පෞද්ගලික මුදලින් ගෙවීම.

වත්කම් = වගකීම් + හිමිකම

| | | |
|---|---|---|
| | | |

21. රු 200 000 ක් මිල වූ භාණ්ඩ ණයට ගැනීම හා එම ණය පියවීමේදී 10% ක මුදල් වට්ටමක් ලැබීම.

වත්කම් = වගකීම් + හිමිකම

| | | |
|---|---|---|
| | | |

**ප්‍රශ්න අංක 22 සිට 23 දක්වා එක් එක් අවස්ථාව සඳහා ඔබගේ උදාහරණ බැගින් ලබාදෙන්න.**

22. වත්කම් අඩුවීම හා වගකීම් අඩුවීම.
-----------------------------------------------------------------------------------------------
-----------------------------------------------------------------------------------------------

23. හිමිකම වැඩිවීම හා හිමිකම අඩුවීම
-----------------------------------------------------------------------------------------------
-----------------------------------------------------------------------------------------------

**24 සිට 25 ප්‍රශ්න පහත රූප සටහන ඇසුරෙන් සම්පූර්ණ කරන්න**

**කළමනාකරණ ගිණුම්කරණ ක්‍රියාවලිය**

| යෙදවුම් | ක්‍රියාවලිය | නිමවුම් |
|---|---|---|
| • ඓතිහාසික තොරතුරු<br>• පුරෝකථන තොරතුරු | 24.<br>( අ ) ..................................<br>( ආ ) ..................................<br>( ඇ ) .................................. | 25.<br>( අ ) ----------------------------------------------------------------<br>( ආ ) ----------------------------------------------------------------<br>( ඇ ) ----------------------------------------------------------------<br>( ඉ ) ---------------------------------------------------------------- |

## II - කොටස

**ප්‍රශ්න 3 කට පමණක් පිළිතුරු සපයන්න.**

1. කීර්තිගේ ව්‍යාපාරයේ පුහුණුවන පොත් තබන්නා විසින් 2018 ජනවාරි මස සිදුවූ ගණුදෙනු ගිණුම්කරණ සමීකරණයේ දක්වා ඇති අයුරු පහත දැක්වේ, සියලු සංඛ්‍යා රු 000 වලිනි.

| ගණුදෙනු අංකය | ජංගම වත්කම් | ජංගම නොවන වත්කම් | හිමිකම | ජංගම වගකීම් | ජංගම නොවන වගකීම් |
|---|---|---|---|---|---|
| ශේෂය | 80 | 200 | 210 | 20 | 50 |
| 1 | -50 | | | | |
| | 80 | | 30 | | |
| 2 | 50 | | | 50 | |
| 3 | -40 | 40 | | | |
| 4 | 80 | | | | 80 |
| 5 | 38 | | | | |
| | -40 | | -2 | | |
| 6 | -5 | | -5 | | |
| 7 | -12 | | -12 | | |
| 8 | | -2 | -2 | | |
| 9 | -7 | | -2 | | -5 |
| 10 | | | 20 | | -20 |
| | | | | | |
| | **174** | **238** | **237** | **70** | **105** |

අතිරේඛ තොරතුරු

1. ජනවාරි මාසයේදී වෙළඳ සල පවත්වාගෙන යාම සඳහා මසකට රු 1 000 ක කුලියකට ගොඩනැගිල්ලක් ගත් අතර එදිනම ඉදිරි මාස දොළහ සඳහා කුලී ගෙවන ලදී.
2. ජංගම නොවන වත්කම් වර්ෂයකට 10%ක් ක්‍ෂය කරනු ලැබේ.
3. රු 7 000 ක ණය වාරිකයක් සෑම මසකම ගෙවිය යුතු අතර එහි රු 2 000 ක ණය පොලියක් අන්තර් ගතවේ.
4. ඉහත ගණුදෙනු අංක 6 හා 10 ලාභය / අලාභය කෙරෙහි බලපෑමක් නොමැත.

**අවශ්‍ය වන්නේ,**

1. අතිරේඛ තොරතුරු අවශ්‍ය තැන් හි දී සැලකිල්ලට ගනිමින් ඉහත එක් එක් ගනුදෙනුව විස්තර කරන්න. ( ලකුණු 10 යි)
2. 2018 ජනවාරි මාසයේ ඉපයූ ශුද්ධ ලාභය හෝ අලාභය සොයන්න. ( ලකුණු 05 යි)
3. ඉහත ලාභය හෝ අලාභය ශුද්ධ වත්කම් ඇසුරෙන් ගණනය කර පෙන්වන්න. ( ලකුණු 05 යි)

( මුළු ලකුණු 20 යි.)

2. 2018 මාර්තු මාසයේ ආරම්භ කල "හරි මග" ප්‍රවාහන සේවයේ සිදුවූ ප්‍රථම කිහිපය පහත දැක්වේ.

1. රු 500 000 වටිනා මෝටර් රථයක් හා රු 500 000 ක් මුදලින් ව්‍යාපාරයට යෙදීම.
2. රු 500 000 ක් මුදලින් හා ඉතිරිය බැංකු ණය පදනමට රු 1000 000 වටිනා මෝටර් රථයක් මිලට ගැනීම.
3. රු 150 000 ක ප්‍රවාහන සේවාවක් අත්පිට මුදලට සිදු කිරීම.
4. රු 40 000 ක ගොඩනැගිලි කුලී මුදලින් ගෙවීම.
5. රු 20 000 ක මෝටර් රථ අලුත් වැඩියාවක් ණය පදනමට සිදු කිරීම.
6. රු 120 000 ක ප්‍රවාහන සේවාවක් ණය පදනමට සිදු කිරීම.
7. අයිතිකරු රු 7 000 ක් තම පුද්ගලික ප්‍රයෝජනයට ගැනීම.
8. රු 15 000 ක් රියදුරු වැටුප් ගෙවීම.
9. රු 40 000 ක බැංකු ණය වාරිකයක් ගෙවූ අතර එයින් රු 5 000 ක් ණය පොලිය වේ.
10. මෝටර් වාර්ෂිකව රු 120 000 ක් ක්ෂය කල යුතුය.

| ගණුදෙනු අංකය | මුදල් | ණය ගැතියෝ | මෝටර් රථ | ප්‍රාග්ධනය | අදායම් | වියදම් | බැංකු ණය | ණය හිමියෝ |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |

අවශ්‍ය වන්නේ,

1. ව්‍යාපාරයේ මාර්තු මස සිදුවූ ගණුදෙනු පහත දැක්වෙන ආකෘතිය යටතේ ගිණුම්කරණ සමීකරණයේ වාර්තා කරන්න. ( ලකුණු 10 යි)
2. ව්‍යාපාරයේ මාර්තු ඉහත සිදුවූ ගනුදෙනුවල අවසන් දිනට මුලා තත්ව ප්‍රකාශනය. ( ලකුණු 05 යි)

( මුළු ලකුණු 15 යි )

3. පහත දැක්වෙන්නේ කපිලගේ වෙළඳ ව්‍යාපාරයේ 2017.04.1 දින පැවති වත්කම් හා වගකීම් පිලිබඳ තොරතුරුවේ,

   මුදල් රු 100 000 , උපකරණ රු 200 000 , භාණ්ඩ තොග රු 50 000, වෙළඳ ලැබිය යුතුදැ රු 40 000, වෙළඳ ගෙවිය යුතු දැ රු 17 000, බැංකු ණය රු 43 000

අප්‍රේල් මාසය තුල පහත ගනු දෙනු සිදුවිය,

1. රු 50 000 ක් වටිනා උපකරණය මිලට ගත්තා.
2. රු 100 000 ක අත්පිට විකුණුම් සිදුකලා.
3. රු 50 000ක භාණ්ඩ නයට මිලදී ගත්තා.
4. රු 80 000ක නයට විකුණුම් සිදුකළා
5. රු 30 000 ක ණය ගැතියෙකු පියවීම සඳහා 10% වට්ටමකට යටත්ව මුදල් ලැබුනා.
6. රු 5 000 ක දුරකථන බිල්පත ගෙවුවා.
7. ව්‍යාපාරයේ රු 10 000 ක ණය හිමියෙකු පියවීම සඳහා 10% ක වට්ටමකට යටත්ව අයිතිකරු තම පෞද්ගලික මුදලින් ගෙවීම.
8. රු 6 000 ක බැංකු ණය වාරිකයක් ගෙවූ අතර එයින් රු 1 000ක් ණය පොලිය වේ.
9. රු 5 000ක මුදල් අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.
10. ව්‍යාපාරයේ ඉතිරි තොගයෙ වටිනාකම රු 20 000කි.

I ). ඉහත ගනුදෙනු පහත ආකෘතිය යටතේ ගිණුම්කරණ සමීකරණයේ දක්වන්න. ( ලකුණු 10 යි)

| ගනුදෙනු අංකය | උපකරණ | භාණ්ඩ තොගය | වෙළඳ ලැබිය යුතු දැ | මුදල් | හිමිකම | වෙළඳ ගෙවිය යුතු දැ | බැංකු ණය |
|---|---|---|---|---|---|---|---|
| ශේෂය | .................. | | | | | | |
| 1 | .................. | | | | | | |

ii). ආරම්භක ශුද්ධ වත්කම වෙනස් වීම සඳහා බලපාන කරුණු ඉහත අභ්‍යාසයෙ උදාහරණ වලින් පෙන්වන්න. ( ලකුණු 05 යි)

**(මුළු ලකුණු 15 යි)**